## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය - 2018

-----------------------------------------

**තත්ත්වාගණනය කළ මතය**

1.1 ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය ,මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයනු ලැබේ.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- සමස්ත ඉදිරිපත් කිරීම හා හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයනු ලැබේ.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සහ

- මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **ශ්‍රී.ලං.ගි.ප්‍ර.01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම :-** විලම්බිත ආදායම් සහ සමුච්චිත අරමුදලින් ඍජුව අඩුකරන ලද මහා ව්‍යාපෘති සඳහා යටිතල පහසුකම් සැලසීම වෙනුවෙන් දරන ලද වියදම් ආශ්‍රිත ගිණුම්කරණ ප්‍රතිපත්ති, ස්වභාවය සහ තත්ත්වයන් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. | මෙම ගණුදෙනුවෙහි ප්‍රමාණය සහ ස්වභාවය අනුව තීරණාත්මක සාධකයක් වශයෙන් වෙන්ව හෙළිදරව් කිරීමට තරම් ප්‍රමාණාත්මක නොවන බැවින් මහා ව්‍යාපෘති සඳහා යටිතල පහසුකම් සැළසීම වෙනුවෙන් දරන ලද වියදම් සමුච්චිත අරමුදලින් ඍජුව අඩුකර තිබේ. කෙසේවෙතත්, විලම්බිත ආදායම් සමග බැඳුනු ස්වභාවයන් සහ අවස්ථාවන් 2019 දී ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ හෙළිදරව් කරණු ලැබේ. | භාවිත කරන්නන්ගේ ආර්ථික තීරණ සඳහා බලපෑම් කලහැකි ගිණුම්කරණ ප්‍රතිපත්ති නොව මූල්‍ය ප්‍රකාශන අවබෝධකර ගැනීම සඳහා අදාලවන විශේෂිතවූ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව්කල යුතුය. |
| (ආ) | **ශ්‍රී.ලං.ගි.ප්‍ර.08 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි :-** 2016 සහ 2017 වර්ෂවලදී ඉන්වොයිස්කර 2018 වර්ෂයේදී අවලංගු කරනලද | අවලංගුකල ඉන්වොයිස්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල විශ්වාසදායී බව අවප්‍රමාණය නොකෙරේ. | පෙර වර්ෂවල සිදුවූ ප්‍රමාණාත්මක වැරදි අනාවරණය කරගැනීමෙන් පසු අනුමත කරනලද ප්‍රථම මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි අතීතානුයෝගීව ගැලපිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.8,964,714ක් වූ බිම්කුලී ආදායම අතීතානුයෝගීව ගැලපීමක් සිදු නොකර සමාලෝචිත වර්ෂයට ගලපා තිබුණි. | | |
| (ඇ) | **ශ්‍රී.ලං.ගි.ප්‍ර.16 - දේපල, පිරියත හා උපකරණ :-** මණ්ඩලය විසින් ස්ථාවර වත්කම් මිලදී ගන්නා ලද වර්ෂයේදී ක්ෂය කර නොතිබුණු අතර අපහරණය කරන වර්ෂයේදී සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්ෂය කිරීම රු. 10,998,848 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | IMAS සඳහා අනුගතවීමේ පහසුව සහ ස්ථාවර වත්කම් මොඩියුලය සරළ කිරීම සඳහා වත්කමක ක්ෂය කලහැකි අගය එහි ප්‍රයෝජනවත් ජීවිතකාලය තුල ක්‍රමානුකූල පදනමකින් බෙදාහැර තිබේ. එසේම මණ්ඩලය විසින් වර්තමාන ක්ෂය ප්‍රතිපත්තිය ශ්‍රීලං.ගි.ප්‍ර. 16 පදනම් කරගෙන සම්පාදනය කර ඇත. | වත්කමක් භාවිතයට ගත හැකි තත්වයට පත්වන අවස්ථාවේ එහි ක්ෂයවීම ආරම්භවන සහ වත්කම අපහරණය කිරීමට පෙර ක්ෂයවීම අවසන්වන ආකාරයෙන් ක්ෂය ප්‍රතිපත්තිය සම්පාදනය කරගත යුතුය. |
| (ඇ) | **ශ්‍රී.ලං.ගි.ප්‍ර.40 - ආයෝජන වත්කම්:-**<br>• මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපයේ පිහිටි පරිපාලනමය අරමුණු සඳහා භාවිතා කරන රු. 18,343,000 ක් වටිනා ඉඩමක් ආයෝජන වත්කමක් වශයෙන් හඳුනා ගෙන තිබුණි. | මෙය 2019 මූල්‍ය වර්ෂය තුලදී නිවැරදි කරනු ලැබේ. | පරිපාලනමය අරමුණින් භාවිතා කරන ඉඩම් ආයෝජන වත්කම් වශයෙන් හඳුනා නොගත යුතුය. |
| | • ආයෝජන වත්කම් යටතේ වර්ගීකරණය කරන ලද ගොඩනැගිලි සම්බන්ධයෙන් යොදාගත් ක්ෂය කිරීමේ ක්‍රමය සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය හෝ යොදාගත් ක්ෂය අනුපාත මණ්ඩලය විසින් හෙළිදරව්කර නොතිබුණි. | මෙය ඉදිරියේදී වෙන්ව හෙළිදරව් කරනු ලැබේ. | ආයෝජන වත්කම් යටතේ වර්ගීකරණය කරන ලද ගොඩනැගිලි සම්බන්ධයෙන් යොදාගත් ක්ෂය කිරීමේ ක්‍රමය සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය හෝ යොදාගත් ක්ෂය අනුපාත හෙළිදරව් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) අය කර ගැනීම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ගෙන් තහවුරු කර ගැනීමකින් තොරව ශ්‍රී ලංකා කජු සංස්ථාවෙන් අය විය යුතු රු. 209,600,000 ක මුදලක් අනෙකුත් ණයගැතියන් යටතේ දක්වා තිබුණි. ඒ අනුව අනෙකුත් ණයගැතියන් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | ඌන ක්‍රියාකාරී ව්‍යවසායයන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත යටතේ පවරාගත් පොත් අගය රු.209,600,000 ක් වූ එවකට කජු සංස්ථා පරිශ්‍රය නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරන ලද අතර වන්දි විනිශ්චය සභාව විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත වන්දි මුදලක් ගෙවිය යුතු බව තීරණය කරන ලදි. එබැවින් ඉහත ගනුදෙනුව සඳහා නීතිමය තත්වයක් ලබා දීමට හැකිවනු පිනිස එම වටිනාකම වෙනත් ණයගැතියන් යටතේ දක්වා ඇත. | විචක්ෂන සංකල්පයට අනුව, ලැබීම් ගිණුම්ගත කලයුතු වන්නේ ඒවා ලැබෙන බවට නිශ්චිත වීමෙන් පසුව පමණි. |
| (ආ) අදාල කාලසීමාව සැළකිල්ලට ගැනීමකින් තොරව සමස්ත වර්ෂය වෙනුවෙන් ක්‍රමක්ෂය ගැලපීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා විලම්බිත වියදම් ක්‍රමක්ෂය රු.1.390,616 කින් වැඩියෙන් දක්වා තිබුණි. | වත්කමෙහි ඇස්තමේන්තුගත ජීවිත කාලය මුළුල්ලෙහි සරල රේඛීය පදනම මත ආදායම් ප්‍රකාශනය තුල ක්‍රමක්ෂය හඳුනා ගැනේ. | ක්‍රමක්ෂය ගැලපීම අදාල කාලපරිච්ඡේදය සැලකිල්ලට ගනිමින් සිදුකල යුතුය. |

.

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත් වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- | --- |
| | රු. | රු. | රු | | |
| කෙරීගෙන යන වැඩ වලින් මාරු කරන ලද ප්‍රාග්ධනිත අගය | 18,404,140 | 0 | 18,404,140 | පිළිතුරු ලබා දී නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වටිනාකම් උපලේඛන සමග අනුරූප විය යුතුය. |

## 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| (අ) විලම්බිත වියදම් ක්‍රමක්ෂය | | | | |
| - මණ්ඩලයේ කාර්යාලය නැවත ස්ථානගත කිරීම | 6,169,237 | 2016 ජනවාරි 01 දිනට පෙර ශේෂය සඳහා ශේෂ සනාථ | මෙම කරුණු පිළිබඳව 2015 ජූලි 14 දින පැවති විගණන කමිටු රැස්වීමේදී සාකච්ඡා කරනලදි. 2015 වර්ෂයේ සිට විලම්භිත වියදම් සම්බන්ධයෙන් ලේඛනයක් නඩත්තු කිරීමට එහිදී එකඟ විය. | ශේෂ සනාථ විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| - විලම්බිත කලාප සංවර්ධන වියදම් | 37,500,264 | 2016 ජනවාරි 01 දිනට පෙර ශේෂය සඳහා ශේෂ සනාථ | | |
| (ආ) ප්‍රාග්ධන කෙරීගෙන යන වැඩ | 19,029,730 | ජ'නල් සටහන් වලට අදාළ තහවුරු කිරීමේ ලේඛන | ජ'නල් සටහන් වලට අදාළ තහවුරු කිරීමේ ලේඛන අමුණා ඇත. | ජ'නල් සටහන් අදාළ ප්‍රභව ලේඛන මගින් සනාථ විය යුතුය. |

## 1.6 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| | අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1978 අංක 04 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 13 (2) (ආ) වගන්තිය ප්‍රකාරව අනුමැතිය ලබාගැනීමෙන් තොරව, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පමණක් ලබාගැනීමෙන් පසු එකතුව රු.529,975,394 ක් වූ දීමනා 7ක් මණ්ඩලය විසින් එහි කාර්ය මණ්ඩලය වෙත ගෙවා තිබුණි. | 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 13(2) වගන්තිය ප්‍රකාරව ඉහත සඳහන් දීමනා/ගෙවීම් සඳහා ගරු අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. | රේඛීය අමාත්‍යංශයේ අමාත්‍ය වරයාගේ අනුමැතිය ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටිනලද අනුමැතිය නොලැබුනු නමුත් පොලී රහිත ණය වර්ග තුනකින් සහ සියයට 4.2 ක පොළී ප්‍රතිශතයකින් යුතු ණය වර්ග හයකින් යුතු සේවක ණය යෝජනා ක්‍රමය 2007 වර්ෂයේ සිට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ ක්‍රියාත්මක වෙමින් පවතින අතර 2018 දෙසැම්බර් 31 දිනට සේවක ණය ශේෂය රු.793,170,825 ක් විය. | මණ්ඩලයේ මානව සම්පත් ප්‍රතිපත්ති අත්පොත සඳහා 2014.03.10 වන දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා ඇත. | සේවක ණය යෝජනා ක්‍රමය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. |
| (ඇ) | ඕනෑම නිවාස කටයුත්තක් සම්බන්ධයෙන් රාජ්‍ය හෝ පෞද්ගලික බැංකුවකින් හෝ ණය සපයන ආයතනයකින් ණය ලබාගත් සේවකයෙකුට සත්‍ය වාර්ෂික ණය පොළිය සහ සියයට 20.5 ක් දක්වා උපරිම සීමාවකට යටත්ව සියයට 4.2 ක පොළිය අතර වෙනස අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ ප්‍රතිපූර්ණය කරනු ලැබේ. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය රහිතව ඉහත ණය යෝජනා ක්‍රමය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු.42,165,668ක මුදලක් ප්‍රතිපූර්ණය කර තිබුණි. | මණ්ඩලයේ මානව සම්පත් ප්‍රතිපත්ති අත්පොත සඳහා 2014.03.10 වන දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා ඇත. | සේවක ණය යෝජනා ක්‍රමය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. |
| (ඈ) | 2007 වර්ෂයේදී මණ්ඩලයේ සභාපති/අධ්‍යක්ෂ ජෙනරාල්ගේ අනුමැතිය යටතේ මල්වත්ත අපනයන සැකසුම් කලාපයේ පිහිටි පර්චස් 41ක විශාලත්වයකින් යුතු ඉඩමක අධිකරණ අමාත්‍යාංශය විසින් ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණු අතර අදාල බලධාරින්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව 2018 වර්ෂයේදී මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉඩම අත්පත්කරගැනීම සඳහා අධිකරණ අමාත්‍යාංශයට අනුමැතිය ලබාදී තිබුණි. | 2018.03.23 පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම ඉඩම අත්පත්කර ගැනීම සඳහා අධිකරණ අමාත්‍යාංශයට අනුමැතිය ලබාදී තිබුණු අතර අධිකරණ අමාත්‍යාංශය විසින් මේ වනවිට අත්පත්කර ගැනීමේ කටයුතු සිදුකරමින් පවතී. | වෙනත් පාර්ශවයන් වෙත ඉඩම පැවරීමට පෙර අදාල බලධාරින්ගෙන් අනුමැතිය ලබාගත යුතුය. |

## 1.7 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.7.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට ආයෝජන මණ්ඩලයේ අනුමත ව්‍යාපාර වලින් ලැබිය යුතු මුදල රු.639,266,361 ක් වූ අතර ඉන් රු. 319,963,217 ක මුදලක් හෙවත් සියයට 50 ක් වර්ෂ දෙකකට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි. | 2012 වර්ෂය දක්වාවූ ලැබියයුතු මුදල් ලිහාහැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති අතර භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීම සඳහා අදාල තොරතුරු රේඛීය අමාත්‍යාංශය වෙත ඉදිරිපත්කර ඇත. එසේම 2013 සිට අය නොවී පවතින ලැබියයුතු මුදල් සම්බන්ධයෙන් පසුවිපරම් කිරීම සඳහා විධායක අධ්‍යක්ෂ (අයකරගැනීම්) පත්කර ඇත. | හිඟහිටි ශේෂයන් ප්‍රමාදයකින් තොරව අයකරගත යුතුය. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වාර්ෂික ගාස්තුව රු.278,701,582 ක් වූ අතර ඉන් රු.172,007,591 ක් හෙවත් සියයට 62 ක් වර්ෂ හතරකට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි. | | හිඟහිටි ශේෂයන් ප්‍රමාදයකින් තොරව අයකරගත යුතුය. |
| (ඇ) | ව්‍යාපාර වලින් ලැබිය යුතු මුදලින් හානිකරණය සඳහා ප්‍රතිපාදනය සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපාර වලින් ලැබිය යුතු මුළු මුදලින් සියයට 58 ක් නියෝජනය කර තිබුණි. හානිකරණය සඳහා වූ රු.372,722,869 ක මුළු ප්‍රතිපාදනයෙන් රු. 300,506,035 ක් හෙවත් සියයට 80 ක් 2018 දෙසැම්බර් 31 දිනට අවලංගු කරන ලද , වසා දැමුණු සහ මෙහෙයුම් අත්හිට වූ ව්‍යාපෘති වලින් ලැබිය යුතු මුදල් සඳහා කරන ලද හානිකරණ ප්‍රතිපාදනයෙන් නියෝජනය විය. | - එම - | හිඟහිටි ශේෂයන් අයකරගැනීම සඳහා නීතිමය පියවර ගැනීම හෝ අයකරගත නොහැකි වටිනාකම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකිරීම කල යුතුය. |
| (ඈ) | ලැබිය යුතු වාර්ෂික ගාස්තුව සඳහා වූ මුළු හානිකරණය සඳහා ප්‍රතිපාදනයෙන් රු.225,471,376 ක් හෙවත් සියයට 91 ක් අවලංගු කරන ලද ව්‍යාපෘති 700 කින් වසා දැමූ ව්‍යාපෘති 67 කින් සහ මෙහෙයුම් අත්හිටුවන ලද ව්‍යාපෘති 38 කින් ලැබිය යුතු මුදල් වලින් නියෝජනය විය. | - එම - | හිඟහිටි ශේෂයන් අයකරගැනීම සඳහා නීතිමය පියවර ගැනීම හෝ අයකරගත නොහැකි ලෙස හඳුනා ගත් වටිනාකම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව |

| | | | |
|---|---|---|---|
| | | | කටයුතු කිරීම කල යුතුය. |
| (ඉ) | වතුපිටිවල නිවාස ඒකක වෙන්දේසිකරුවකු වූ පුද්ගලික සමාගමකින් ලැබිය යුතු රු.1,604,200 ක මුදලක් වර්ෂ අටකට අධික කාලයක සිට අය නොවී පැවති අතර එම සමාගම හා මණ්ඩලය අතර ගිවිසුමක් පවතින බවට තහවුරු කර ගැනීමට කිසිදු සාක්ෂියක් නොතිබුණි. | නීතිපතිට අනුව නඩු පැවරිය හැකි කාලසීමාව ඉක්මවා ගොස් ඇති බව සඳහන්වන අතර මුදල් අයකර ගැනීම සඳහා ණයගැතියාට එරෙහිව ගතහැකි සිවිල් නීතිකෘත්‍යයද මණ්ඩලය සම්බන්ධයෙන් සාර්ථක නොවිය හැක. කෙසේ වෙතත් පොලිසියට කරන ලද ප්‍රකාශයක් මගින් හෝ එන්තර වාසියකට ලද ප්‍රතිචාරයක් මඟින් ලැබියයුතු මුදල් සම්බන්ධයෙන් පිළිගැනීමක් ලබා ගත හැකිනම් කාලාවරෝධය මැඩපැවැත්වීම සහ නීතිමය ක්‍රියාමාර්ග සඳහා පෙළඹීමේ හැකියාවක් තිබිය හැක. | නීතිපතිට අනුව කාලීන වශයෙන් කටයුතු කළ යුතුය. |
| (ඊ) | රජයේ ආයතන වලින් ලැබිය යුතු රු.37,680,103 ක් වසර 4 ට වැඩි කාලයක් අය නොවී පැවතුණි. | ව්‍යාපෘතියක් සඳහා ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ දේපල ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත මුදාහල පසු ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් අයවියයුතු මුදල පියවාගත හැකිවනු ඇති අතර අනෙකුත් හිඟහිටි මුදල් සම්බන්ධයෙන් ණයගැතියන් වෙත සිහිකැඳවීම් යවා ඇතත් ඔවුන් ඒ සඳහා ප්‍රතිචාර දක්වා නැත. | හිඟහිටි ශේෂයන් අයකරගැනීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ග ගතයුතුය. |

### 1.7.2 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එකතුව රු. 5,798,464 ක් වූ විවිධ ණයහිමියන් වර්ෂ 3 කට වැඩි කාලයක් නිරවුල් කර නොතිබුණි. | නිරීක්ෂණය සටහන් කරගෙන ඇත. | ගිවිසගත් කාල පරිච්ඡේදය තුල ණයහිමියන් පියවිය යුතුය. |
| (ආ) | එකතුව රු.49,524,019 ක් වූ රඳවාගැනීම් මුදල් වලින් කොන්ත්‍රාත් 26 ට අදාළ රු.5,005,395 ක මුදලක් වර්ෂ තුනකට වැඩි කාලයක් නිරවුල් කිරීමෙන් තොරව පැවතුණි. | ඇතැම් රඳවාගැනීම් මුදල් ආදායම් ලෙස සලකනු ලබන අතර ඇතැම් රඳවාගැනීම් මුදල් ගෙවීම් කිරීම සඳහා අනුමැතියට ඉදිරිපත්කර ඇත . | නිදහස්කල හැකි මුදල් නිදහස් කිරිමට පියවර ගතයුතු අතර අනෙකුත් මුදල් ආදායම් ලෙස සලකා කටයුතු කල යුතුය. |
| (ඇ) | එකතුව රු.234,050,995ක් වූ ඉදිරියට ලැබීම් අතරින් රු.63,746,513 වසර තුනකට අධික කාලයක් තිස්සේ නොපියවා පවතින අතර මෙම මුදල තුල ඉඩමක් අත්පත්කර ගැනීම සඳහා පෞද්ගලික සමාගමකින් ලද රු.60,782,681ක මුදලක් ඇතුලත්ව තිබුණි. | සී/ස වෙස්ටන් ඔටෝමෝබයිල් (පුද්ගලික) සමාගමේ ගිවිසුම මේ වන විටත් සකස්කර අවසන් නොමැත. එමනිසා ලද මුදල ඉදිරියට ලැබීම් යටතේ නිරූපණය කිරීමට සිදුවිය. | ගිවිසුම සකස්කර අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.8 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අදාල අමාත්‍යවරයා විසින් ලබාදුන් අනුමැතිය රහිතව 2018 වර්ෂය තුළ රු. 14,406,337,500ක මුදලක් මණ්ඩලය විසින් ආයෝජනය කර තිබුණි. | අංක 02/2018 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන ඇත. | මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වයද ඇතිව අදාල අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි 104(3) සහ 104(4) | 2018 වර්ෂය තුල සිදුවූ වාහන අනතුරු 11ක් සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ වාර්තා හෝ වාහන අනතුරු 10ක් සම්බන්ධයෙන් සම්පූර්ණ පරීක්ෂණ වාර්තා 2018 දෙසැම්බර් 31 දින වන තුරුත් මණ්ඩලය විසින් ඉදිරිපත්කර නොතිබුණි. | වාහන අනතුරු ඉතා සුළු ප්‍රමාණයේ ඒවා වූ අතර ඒවා වෙනත් රියදුරන්ගේ දෝෂ හේතුවෙන් සිදුවී තිබුණි.හැකි සෑම අවස්ථාවකදිම මණ්ඩලය විසින් ආසන්නතම පොලිස් ස්ථානය වෙත පැමිණිලි කර ඇත | සම්පූර්ණ පරීක්ෂණයක් සිදුකිරීමට දින 7කට වැඩි කාලයක් ගත වන්නේ නම් කඩිනමින් මූලික පරීක්ෂණ වාර්තාවක් යැවිය යුතු අතර විමර්ශනයෙන් පසු හානිය සිදුවූ දින සිට මාස 3ක් ඇතුළත සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත්කල යුතුය. |
| (ඇ) | 2016 ඔක්තෝබර් 27 දිනැති පී.ඊ.ඩී 1/2015 (i) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 02 වන වගන්තිය | සමාලෝචිත වර්ෂය තුල මණ්ඩලයේ නිලධාරීන් 25 දෙනෙකු වෙත රියදුරු දීමනා වශයෙන් රු.5,145,435ක් ගෙවා තිබුණි. | වෙන්කල වාහන හිමි නිලධාරීන් වෙත රියදුරෙකු සැපයීමට වඩා දීමනාවක් ගෙවීම, මූල්‍යමය සහ පරිපාලනමය වශයෙන් පිරිවැය ප්‍රතිලාභ සහිත වන බැවින් මෙම ගෙවීම නිර්දේශ කරනලදි. | නිලධාරීන් වෙනුවෙන් රියදුරෙකු සැපයීම හෝ රියදුරු දීමනාවක් ගෙවීම නොකල යුතුය. |
| (ඇ) | 2018 දෙසැම්බර් 07 දිනැති පී.ඊ.ඩී 3/2018 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | මණ්ඩලය විසින් ඉහත චක්‍ර ලේඛයට පටහැනිව ස්ථිර සේවකයෙකු සඳහා රු.50,000 ක් හෝ එක් මසක වැටුප යන දෙකෙන් වැඩි වටිනාකමද, අනියම් සහ කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයෙකු සඳහා රු.50,000 ක් බැගින්ද වාර්ෂික ප්‍රසාද දීමනා වශයෙන් ගෙවා තිබුණු අතර 2018 වර්ෂය සඳහා ප්‍රසාද දීමනා වශයෙන් රු.66,216,152 ක් ගෙවා තිබුණි. | 2018 වර්ෂය සඳහා ප්‍රසාද දීමනා වශයෙන් ස්ථිර සේවකයන් සඳහා රු.50,000 හෝ එක් මාසයක වැටුප යන දෙකෙන් වැඩි වටිනාකමද අනියම් සහ කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයන් සඳහා රු.50,000 බැගින්ද ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය දී තිබේ. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මණ්ඩලය විසින් ප්‍රසාද දීමනා ගෙවිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 759,093,091 ක අතිරික්තයක් අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 756,424,050 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,669,041 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව මුළු වියදම රු.182,612,458 කින් වැඩිවීමට ප්‍රතිරූපීව අයභාරය සහ මූල්‍ය ආදායම පිළිවෙලින් රු.177,751,776 කින් සහ රු.7,529,723 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කටුනායක අපනයන සැකසුම් කලාපය විසින් වර්ෂය තුල කලාපයේ ඝන අපද්‍රව්‍ය බැහැරකිරීම වෙනුවෙන් රු.12,426,186ක මුදලක් වියදම්කර ඇති අතර ඒ වෙනුවෙන් ව්‍යාපාර වලින් රු.4,259,323 ක මුදලක් පමණක් අයකරගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඝන අපද්‍රව්‍ය බැහැරකිරීම සම්බන්ධයෙන් කලාපය විසින් 2018 වර්ෂය තුලදී රු.8,166,863ක අලාභයක් ලබා ඇත. | ඝන අපද්‍රව්‍ය බැහැරකිරීම සඳහා භාවිත කල ඉඩම හිස්වී ඇති අතර ඉන් අක්කර 12ක් පමණ නව ආයෝජන ව්‍යාපෘති සඳහා වෙන්කර ඇත. ඒ අනුව නව කසල බැහැර කිරීමේ ක්‍රමවේදය තුලින් ඉඩම් සම්පත ආරක්ෂා කරගනිමින් ආර්ථිකමය වශයෙන් මෙන්ම පාරිසරික වශයෙන්ද කටුනායක අපනයන සැකසුම් කලාපය වඩා යහපත් තත්වයකට පත්කර තිබේ. | ආයෝජන සඳහා ඉඩම් යොදාගැනීම ප්‍රශස්ත කර ගන්නා අතරම ඝන අපද්‍රව්‍ය බැහැරකිරීමේ අලාභය අවම කරගත යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් රු.630,340,562 ක්වූ කොන්ත්‍රාත් අගයකට ඉදිකර 2016 වර්ෂයේදී මණ්ඩලය වෙත පවරාදුන් මීරිජ්ජවිල අපනයන සැකසුම් කලාපයේ අභ්‍යන්තර මාර්ග ප්‍රවාහනය සඳහා නුසුදුසු තත්වයක පැවතුනි. මණ්ඩලය විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත රු.516,964,285ක මුදලක් ගෙවාඇති අතර මණ්ඩලය විසින් මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරිය සහ මණ්ඩලය අතර කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ නොමැති අතර රේඛිය අමාත්‍යාංශයේ මගපෙන්වීම අනුව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් සිදුකරනු ලබන විධිමත් අධ්‍යයනයකින් පසු තීරණයට එළඹෙන තෙක් ඉතිරි මුදල ගෙවීම අත්හිටුවා ඇත. | ව්‍යාපෘතිය ආරම්භකිරීමට පෙර කොන්ත්‍රාත්කරු සමග ලිඛිත ගිවිසුමකට එළඹිය යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සීතාවක, කොග්ගල සහ කටුනායක අපනයන සැකසුම් කලාපයන්හි සහ මහනුවර කාර්මික උද්‍යානයෙහි පිහිටි වර්ග අඩි 48,868 ක විශාලත්වයකින් යුතු පරිශ්‍ර පනස් හතක් රු. 18,660,234 ක වාර්ෂික කුලියක් යටතේ ලිඛිත ගිවිසුමකට ඇතුළත් වීමකින් තොරව භාහිර පාර්ශවයන් වෙත බදු දී තිබුණි. | ගිවිසුම් සකස්කර අවසන්කිරීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී. | ප්‍රමාදයකින් තොරව ගිවිසුම් වලට එළඹිය යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂය සහ ඉකුත් වර්ෂ හතර සඳහා ආයෝජන මණ්ඩල පනතේ 17 වගන්තිය යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වල ප්‍රගතිය පහත දැක්වේ. | | |

| වර්ෂය | ගිවිසුම් අත්සන් කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව (නව ගිවිසුම් සහ දීර්ඝ කිරීම්) | වාණිජ කටයුතු ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව (නව ගිවිසුම් සහ දීර්ඝ කිරීම්) | අත්හිටුවන ලද වසා දමන ලද හෝ ගිවිසුම් අවලංගු කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|
| | | | අත්හිටුවන ලද | වසා දමන ලද | ගිවිසුම් අවලංගු කරන ලද |
| 2018 | 94 | 66 | 10 | 23 | 156 |
| 2017 | 103 | 82 | 4 | 6 | 152 |
| 2016 | 186 | 83 | 3 | 6 | 79 |
| 2015 | 157 | 100 | 2 | 12 | 23 |
| 2014 | 160 | 101 | 0 | 11 | 56 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | | |
|---|---|---|
| • වර්ෂ 2016 සිට 2018 දක්වා කාල පරිච්ඡේදය තුළ ගිවිසුම් අත්සන් කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව ක්‍රමයෙන් අඩු වී තිබුණි. | ආකර්ශනීය දිරිදීමනා ක්‍රමයක් නොමැතිවීම හේතුවෙන් 2016 වර්ෂයෙන් පසු නව ආයෝජන යෝජනා ලැබීමේ කැපීපෙනෙන අඩුවීමක් සිදුවිය. | ගිවිසුම් අත්සන්කරන ව්‍යාපෘති සංඛ්‍යාව වර්ධනය කිරීම සඳහා කටයුතුකල යුතුය. |
| • වර්ෂ 2014 සිට 2018 දක්වා කාල පරිච්ඡේදය තුළ ව්‍යාපාර කටයුතු ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාවෙහි කැපීපෙනෙන අඩුවීමක් නිරීක්ෂණය විය. | මෙහෙයුම් ආරම්භ කිරීමට පෙර ආයෝජකයා විසින් විවිධ අනුමැතීන් ලබාගැනිම අවශ්‍ය බැවින් ආයෝජන මණ්ඩලයේ පාලනයෙන් බැහැරවූ විවිධ හේතූන් මත ව්‍යාපෘතීන්වල වානිජ මෙහෙයුම් ආරම්භ කිරීම ප්‍රමාදවී ඇත.ඊට අමතරව 2014 වසරේ දේශීය ආදායම් නීතිය මගින් බදුසහන කාලසීමාවන් අත්හිටුවීම සහ ආයෝජන ගෙනඒම සඳහාවූ දින සීමා හඳුන්වාදීම මගින් ව්‍යාපෘතීන් ඉදිරියට ගෙනයෑම සම්බන්ධයෙන් ආයෝජකයන් අතර ව්‍යාකූලත්වයක් ඇතිකල අතර ඒ හේතුවෙන් පසුගිය වර්ෂ වලදී ව්‍යාපෘතීන්වල මෙහෙයුම් ආරම්භ කිරීමේ ප්‍රමාදයක් ඇතිවිය. | අනෙකුත් අධිකාරය ලත් ආයතන වෙතින් අනුමැතීන් ලබාගැනීමට ආයෝජකයන්ට සහයවීම සඳහා මණ්ඩලය විසින් ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය. |
| • සමාලෝචිත වර්ෂය තුලදී ගිවිසුම් අවලංගු කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව ව්‍යාපාර කටයුතු ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාවට වඩා වැඩි බව නිරූපනය විය. | ක්‍රියාත්මක නොවූ සහ ආයෝජන උපලබ්ධි නොවී දීර්ඝ කාලයක් පැවති ව්‍යාපෘති වල ගිවිසුම් අවලංගු කරන ලදී. පසුගිය වර්ෂවලදී ව්‍යාපෘතීන් වලින් වැඩි ප්‍රමාණයක් අත්හිටවීම/ වසාදැමීම සිදුකල අතර කඩිනම් කිරීමේ ක්‍රියාවලියෙහි ප්‍රතිඵලයක් වශයෙන් 2018 දී ගිවිසුම් අවලංගු කරන ලදී. | ගිවිසුම් අවලංගු වීම අඩුකිරීමට සහ ව්‍යාපෘති ආරම්භකිරීම වර්ධනය කිරීමට මණ්ඩලය විසින් පියවරගත යුතුය. |

**3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2010 අගෝස්තු 17 දිනැති අංක 259/09 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවේ විධිවිධාන පදනම්කොටගෙන රු.26,100,000ක් වූ ආයෝජකයා විසින් දරන ලද ඉඩම් සංවර්ධන පිරිවැය මණ්ඩලය විසින් ප්‍රතිපූරණය කර තිබුණි. කෙසේ වෙතත්, ආයෝජකයා විසින් ඉඩම සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් මණ්ඩලය සහ ආයෝජකයා අතර විධිමත් ගිවිසුමක් නොපැවති අතර ඉඩම සංවර්ධනය කිරීමෙන් පසුව ආයෝජකයාගේ ඉල්ලීම මත ප්‍රතිපූර්ණය කිරීම සිදුකර තිබුණි. | ප්‍රමාණ බිල්පත්‍ර සහ ඉඩම සංවර්ධනය කිරීමෙන් පසු ආයෝජකයා විසින් ඉදිරිපත්කරන ලද අනෙකුත් අදාල තොරතුරු සියුම්ව ඇගයීමෙන් පසු අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත ඉඩම සංවර්ධනය කිරීමේ පිරිවැය ප්‍රතිපූරණය කර තිබුණි. එමනිසා ආයෝජකයා සහ මණ්ඩලය අතර එකගතාවයක් නොපැවති අතර එබැවින් කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් නොකරන ලදි. | ආයෝජකයා විසින් ඉඩම සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් සංවර්ධනය කිරීමේ නිර්නායක සහ ගෙවීම් කොන්දේසි ඇතුලත් ගිවිසුමකට මණ්ඩලය සහ ආයෝජකයා විසින් එළඹිය යුතුය. |

**3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වසර 4කට වැඩිකාලයක් අනවසර පාර්ශවයක් විසින් පරිහරණය කරනු ලබන රු.6,500,000ක වටිනාකමකින් යුතු වර්ග අඩි 1738ක් වූ ගොඩනැගිල්ලක් සහිත පර්චස් 39.2ක වපසරියකින් යුතු වතුපිටිවෙල අපනයන සැකසුම් කලාපයේ පිහිටි ඉඩමක් වසර 10කට වැඩිකාලයක් නිශ්කාර්යයව පැවතුනි. කෙසේ වෙතත් මණ්ඩලයට ආදායමක් ඉපයියහැකි ආකාරයෙන් දේපල භාවිතා කිරීමට හෝ අනවසර පදිංචිකරු නෙරපා හැරීමට මණ්ඩලය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අදාළ පාර්ශවය විසින් ඉහළ බලධාරින් වෙත ඉදිරිපත් කරන ලද බොහෝ අභියාචනා සහ නියෝජන හේතුවෙන් මෙම කාර්යය ප්‍රමාද වූ අතර මණ්ඩලයේ තිරණයක් අනුව රාජ්‍ය ඉඩම් (පවරාගැනීමේ) පනත යටතේ නෙරපා හැරීමේ ක්‍රියාවලිය ඉදිරියට ගෙනයාමට නියමිතය. | අනවසර පදිංචිකරු නෙරපාහැරීමට සහ දේපල නිසි ආකාරයෙන් භාවිතා කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගතයුතුය. |

### 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ආ) ප්‍රකාරව අවම වශයෙන් වසර තුනක කාල පරිච්ඡේදයකට අදාල ක්‍රියාකාරකම් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් කර නොතිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඉ) ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස හය නොඉක්මවන කාල පරාසයන් තුළ අඛණ්ඩව යාවත්කාලීන කර නොතිබුණි. | එකග වේ. | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය සමග අනුගත විය යුතුය. |
| (ආ) 2018 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැළසුම් කරන ලද ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 559.29 ක් වූ අපනයන සැකසුම් කලාප සහ කාර්මික උද්‍යාන නවයකට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් හතළිස් තුනක් වර්ෂය තුළදී නිමකර නොතිබුණි. | විවිධ හේතුන් මත ප්‍රමාදවීම් සිදුවිය. | වසර තුල නිමකිරීමට සැළසුම්කල ප්‍රසම්පාදන කාර්යයන් සැළසුම්කල පරිදි නිමකල යුතුය. |

### 3.7 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (i) මණ්ඩලයේ තථ්‍ය මානව සම්පත් අවශ්‍යතාවයන් සැලකිල්ලට ගැනීමකින් තොරව කොන්ත්‍රාත් පදනමින් සහ අනියම් පදනමින් සේවකයන් ගණනාවක් බඳවා ගැනීම හේතුවෙන් කළමනාකරණ සහකාරවරුන් (තාක්ෂණික නොවන) 66 ක් සහ ප්‍රාථමික මට්ටමේ (නුපුහුණු) සේවකයන් 106 ක් අනුමත කාර්ය මණ්ඩලයට වඩා අතිරික්තව පැවතුණි. | මෙම සේවකයන් මණ්ඩලයේ අත්‍යවශ්‍ය දෛනික කාර්යයන් සඳහා යෙදවීමේ අරමුණින් බඳවාගෙන ඇත. | සේවකයන් බඳවාගැනීමේදී මණ්ඩලයේ මානව සම්පත් අවශ්‍යතාවය සැලකිල්ලට ගතයුතුය. |

| | | |
|---|---|---|
| (ii) 1997 ඔක්තෝබර් 24 දිනැති අංක 124 දරන මුදල් චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව, 2018 දෙසැම්බර් 31 දින වන විට නිළධාරීන් පස් දෙනෙකු පුරප්පාඩු වූ තනතුරු වල වැඩ ආවරණය කිරීම සඳහා මාස 06 සිට මාස 56 ක් දක්වා වූ කාලපරිච්ඡේදයක් සඳහා යොදවා තිබුණි. | වැඩබැලීමේ පදනම මත ආවරණය වන තනතුරු පිරවීම සඳහා ඉදිරියේදී ක්‍රියාමාර්ග ගනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රතිපාදන අනුගමනය කලයුතුය. |
| (iii) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 හා 9.4 වගන්ති වලට පටහැනිව, මණ්ඩලයේ සේවකයන් තුන් දෙනෙකු නියමිත අනුමැතිය ලබගැනීමෙන් තොරව සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණු අතර 2018 වර්ෂය සඳහා වැටුප් හා අතිකාල දීමනා ලෙස රු.3,913,277 ක මුදලක් වියදම් කර තිබුණි. | එක් සේවකයෙකු මණ්ඩලයේ සේවය සඳහා නැවත කැඳවා ඇති අතර අනෙකුත් සේවකයන් දෙදෙනා 2018.12.31 දින වන තුරුත් මණ්ඩලය වෙත මුදාහැර නොමැත. | අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරව රේඛීය අමාත්‍යාංශය වෙත හෝ වෙනත් කිසිදු ආයතනයක් වෙත සේවකයන් මුදා නොහැරිය යුතු අතර එම කාලය තුල ආයතනය විසින් නිදහස්කල සේවකයන් වෙත කිසිදු පාරිශ්‍රමිකයක් නොගෙවිය යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව 2018 වර්ෂය තුළ නිමකිරීමට සැළසුම් කරන ලද රු. මිලියන 1757.49 ක ප්‍රතිපාදන සහිත ක්‍රියාකාරකම් එකසිය දහ අටක් සැළසුම් කළ පරිදි නිම කර නොතිබුණි. | ඇතැම් ක්‍රියාකාරකම් නියමිත දිනට නිමකර ඇති අතර අනෙකුත් ක්‍රියාකාරකම් විවිධ හේතූන් මත සිදුකෙරෙමින් පවතී. | වර්ෂය තුළ නිමකිරීමට සැළසුම් කරන ලද ක්‍රියාකාරකම් සැළසුම් කළ පරිදි නිම කළ යුතුය. |

## 4.2 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කටුනායක, සීතාවක සහ වතුපිටිවෙල අපනයන සැකසුම් කලාප පරිසර ආරක්ෂණ බලපත්‍ර (EPL) ලබාගැනීමෙන් තොරව ක්‍රියාත්මකවන අතර මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රමිතීන්ට අනුගත නොවීම හේතුවෙන් කටුනායක අපනයන සැකසුම් කලාපයේ පිහිටි ව්‍යාපාර 4ක් පරිසර ආරක්ෂණ බලපත්‍රය රහිතව මෙහෙයුම් කටයුතු සිදුකරනු ලබයි. | කෙටි කාලයක් තුළ අදාල කලාප සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගැනීමට මණ්ඩලය විසින් අවශ්‍ය පියවර ගනිමින් සිටියි. පිරිපහදුකල අපජලයෙහි අනුකූල නොවීම් හේතුවෙන් ව්‍යාපාර සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම අත්හිටුවා ඇත. | අපනයන සැකසුම් කලාප සඳහා ප්‍රමාදයකින් තොරව පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගැනීමට මණ්ඩලය ක්‍රියාමාර්ග ගතයුතු අතර ප්‍රමාදයකින් තොරව පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගැනීමට හැකිවන ආකාරයෙන් පරිසර ප්‍රමිතීන්ට අනුගත වීම සම්බන්ධයෙන් ව්‍යාපාර උනන්දු කළ යුතුය. |